**ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 පෙබරවාරි 21 දින සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම, අදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

--------

### 2.1 විසර්ජන ගිණුම

----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

දෙපාර්තමේන්තුව සඳහා පුනරාවර්තන වියදම් සඳහා පමණක් රු. මිලියන 49.20 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 47.44 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 1.76 ක් හෙවත් සියයට 3.58 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

### 2.2 ආදායම් ගිණුම්

----------------

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්**

---------------------------------------

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේත දෙකක් සඳහා එකතුව රු.මිලියන 155.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 189.58 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 122.31 ක් විය. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම/ (ඌනතාවය) | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 20.03.02.10 | 140.00 | 169.01 | 29.01 | 20.72 |
| 20.03.02.12 | 15.00 | 20.57 | 5.57 | 37.13 |
| **එකතුව** | **155.00** | **189.58** | **34.58** | **22.31** |

## 2.3 අත්තිකාරම් ගිණුම

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 29701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. මිලියන | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 29701 | 5.04 | 3.89 | 2.84 | 3.59 | 20.00 | 12.11 |

## 2.4 විගණන නිරීක්ෂණය

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

# 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ආදායම් ගිණුම්

දෙපාර්තමේන්තු ප්‍රධානියාට ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් ආදායම් සංකේත 02 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය පැවැරි තිබුණි. එම ආදායම් සංකේතවලට අදාලව සිදු කළ නියැදි විගණනයේ දී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **20.03.02.10 දරන ආදායම් සංකේතය - සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු**

විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.මිලියන 209.41 ක ආදායම් හිඟහිට තිබුණු අතර, සමාලෝචිත වර්ෂයට අදාළව හිඟහිටි ආදායම රු.මිලියන 73.88 ක් විය. හිඟහිටි ආදායම අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) **20.03.02.12 දරන ආදායම් සංකේතය - පොදු කොන්ත්‍රාත් පනත යටතේ අය කරනු ලබන ගාස්තු**

වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව රු.මිලියන 20.00 ක ආදායම් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබූ අතර, ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 15.00 දක්වා සංශෝධනය කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 20.57 ක ආදායම් රැස්කිරීමට දෙපාර්තමේන්තුවට හැකි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රැස් කළ හැකිව තිබුණත්, ඒ සඳහා දෙපාර්තමේන්තුව විසින් නිවැරදි ලෙස ආදායම් පුරෝකථනයක් කිරීමට අපොහොසත්වීම නිසා එම ඇස්තමේන්තුගත ආදායම සංශෝධනය කර තිබුණි.

## 3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 29701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.137,741 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 27 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව ණය ශේෂය හා භාණ්ඩාගාර පොත් අනුව ණය ශේෂය අතර රු.3,665 ක වෙනසක් පැවැතුණි. එම වෙනස මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නිවැරදි කර නොතිබුණි.

## 3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.3.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ගොඩනැගිල්ල නවීකරණය කිරීමේදී ගලවා ඉවත් කරන ලද වීදුරුවල අගය ගණනය කර නොතිබුණු අතර 2015 ඔක්තෝබර් 09 දින පැවති වෙන්දේසියට හෝ ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව වර්ෂ තුනකට ආසන්න කාලයක් වීදුරු සුරක්ෂිතභාවයකින් තොරව තැනින් තැන දමා තිබුණි.

## 3.5 අනුකූල නොවීම්

### නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | |
| (අ) 5.2.1 (අ) මාර්ගෝපදේශය | ලංසු කැඳවීමට ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය කෙරෙන සියළු තොරතුරු ලංසු කැඳවීමේ ලේඛන මඟින් සපයා දිය යුතු වුවත්, එම විධිවිධානවලින් බැහැරව කටයුතු කළ අවස්ථා තිබුණි. ඒ අනුව, ලංසු කැඳවීමේ ලේඛන අසම්පූර්ණ තත්ත්වයෙන් පැවතුණි. |
| (ආ) 5.3.11 (අ) මාර්ගෝපදේශය | ලංසු කැඳවීමේදී ලංසු සුරක්ෂණ ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) 5.4.8 (අ) මාර්ගෝපදේශය | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි. |

## 3.6 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්

දෙපාර්තුමේන්තුව විසින් ඉටු කර තිබුණු කාර්යයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වා ඇත. ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

| කාර්යය | සංඛ්‍යාව | | වෙනස (අඩුවීම)/ වැඩිවීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | 2015 | 2014 | | |
| **සමාගම් වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීම** | | | | |
| සමාගම් සංඛ්‍යාව | 41,199 | 31,305 | 9,894 | 31.61 |
| ආදායම රුපියල් | 206,005,000 | 156,525,000 | 49,480,000 | 31.61 |
| **මූල්‍ය වාර්තා ලියාපදිංචි කිරීම** | | | | |
| සමාගම් සංඛ්‍යාව | 2,509 | 2,376 | 133 | 5.60 |
| ආදායම රුපියල් | 2,509,000 | 2,376,000 | 133,000 | 5.60 |
| **නව සමාගම් ලියාපදිංචිය** | | | | |
| සමාගම් සංඛ්‍යාව | 8,361 | 7,100 | 1,261 | 17.76 |
| ආදායම රුපියල් | 128,895,000 | 109,435,000 | 19,460,000 | 17.78 |
| **ගණන් පරීක්ෂක ලියාපදිංචිය අලුත් කිරීම** | | | | |
| ගණන් පරීක්ෂකවරුන්/ ගණන් පරීක්ෂක සමාගම් සංඛ්‍යාව | 406 | 532 | (126) | (23.68) |
| ආදායම රුපියල් | 1,267,748 | 927,632 | 340,116 | 36.66 |
| **සමාගම් ලේකම්වරුන් ලියාපදිංචිය** | | | | |
| ලේකම්වරුන්/ ලේකම් සමාගම් සංඛ්‍යාව | 565 | 566 | (1) | (0.18) |
| ආදායම රුපියල් | 1,465,000 | 1,462,500 | (2,500) | (0.17) |
| **සහතික කල පිටපත් නිකුත් කිරීම** | | | | |
| පිටපත් සංඛ්‍යාව | 51,207 | 43,379 | 7,828 | 18.05 |
| ආදායම රුපියල් | 26,279,380 | 22,795,784 | 3,483,596 | 15.28 |
| **සමාගම් ගොනු පරීක්ෂා කිරීම** | | | | |
| සමාගම් ගොනු සංඛ්‍යාව | 12,066 | 10,838 | 1,228 | 11.33 |
| ආදායම රුපියල් | 6,033,040 | 5,420,090 | 612,950 | 11.31 |

**සමිති වාර්ෂික වාර්තා ගොනු කිරීම**

| | | | | |
|---|---|---|---|---|
| සමිති සංඛ්‍යාව | 31 | 19 | 12 | 63.16 |
| ආදායම රුපියල් | 31,000 | 19,000 | 12,000 | 63.16 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2007 අංක 7 දරන සමාගම් පනතේ 131(1) හා (2) වගන්ති ප්‍රකාරව, සෑම සමාගමක් විසින්ම ගෙවිය යුතු වාර්ෂික වාර්තා ආදායමෙන්, සමාලෝචිත වර්ෂයේදී ලැබූ ආදායම රු.205,995,000 ක් වී තිබුණි. එසේම 2015 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ආදායම රු.628,239,996 ක් වී තිබුණු අතර එය 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි.

**(ආ) 2007 අංක 7 දරන සමාගම් පනත**

සමාගම් පනතට අනුකූලව සීමිත සමාගම් ලියාපදිංචි කිරීම සහ එමගින් නියම කර තිබුණු විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි සමාගම්වල කටයුතු මෙහෙයවීම කළ යුතුව තිබුණි. එම සමාගම් ඒ අනුව ක්‍රියාකරන බවට වග බලා ගැනීමත්, එසේ ක්‍රියා නොකරන අවස්ථාවලදී සමාගම් පනතෙන් නියම කර ඇති බලතල අනුව ක්‍රියාකර ලියාපදිංචි සමාගම්වල කටයුතු පනතේ විධිවිධානවලට අනුකූලව පවත්වා ගෙන යාම සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ට පැවරී ඇති ව්‍යවස්ථාපිත කාර්යයක් වී තිබුණි. ලියාපදිංචි සමාගම්වල කටයුතුවල නියාමනය දුර්වල තත්ත්වයක පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. එසේම, සමාගම් පනත යටතේ ලියාපදිංචි වී තිබූ නමුත් දැනට අක්‍රිය තත්ත්වයේ පවතින සමාගම් පිළිබඳ විධිමත් වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඇ) 1891 අංක 16 දරන සමිති ආඥා පනත**

සමලෝචිත වර්ෂය අවසානය වන විට සමිති 12,311 ක් ලියාපදිංචි වී තිබුණු අතර ඉන් සමිති 11,750 ක වාර්ෂික වාර්තා ගොනු කළ යුතුව තිබුණි. නමුත් 2015 දෙසැම්බර් 31 දිනට වාර්ෂික වාර්තා ගොනු කළ ලියාපදිංචි කරන ලද සමිති සංඛ්‍යාව 31 ක් වූ අතර ඉන් අයකර ගත් ආදායම අයකර ගත යුතු ආදායමෙන් සියයට 0.26 ක් පමණක් විය.

**(ඇ) 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත**

1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතේ විධිවිධාන අනුව රු.5,000,000 ක් ඉක්මවන සෑම පොදු කොන්ත්‍රාත්තුවක්ම සමාගම් රෙජිස්ට්‍රාර්වරයා යටතේ ලියාපදිංචි කළ යුතු ය. සමාලෝචිත වර්ෂයේදී පොදු කොන්ත්‍රාත් 12,217 ක් ලියාපදිංචි කර තිබූ අතර ඉන් ලැබූ ආදායම රු.20,568,000 ක් විය. ඉකුත් වර්ෂයේදී එම ප්‍රමාණය 10,387 ක් වූ අතර ඉන් ලැබූ ආදායම රු.17,016,000 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 29ක වර්ධනයක් සිදු වී තිබුණි.

## 3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2007 මාර්තු 29 දිනැති අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත වෙළඳ හා පාරිභෝගික සේවා අමාත්‍යාංශය මඟින් සීමිත සමාගමකට අයත් කොටස් මිලදී ගැනීම සඳහා සමාගම් අරමුදලින් රු. 90,275,000 ක් වැය කර තිබුණි. මෙම සමාගම 2013 වර්ෂයේ සිට බූන්වත් වී තිබුණු බව අනාවරණය වී තිබූ නමුත් 2016 දෙසැම්බර් 31 දින වන විටද, ඒ පිළිබඳ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 3.8 කළමනාකරණ අකාර්යක්ෂමතා

සමාගම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පරිගණකගත කිරීමේ කොන්ත්‍රාත්තුව 2014 ජනවාරි 21 දින රු.88,812,228 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කාර්යසාධන සුරක්ෂණයක් ලබා නොගෙන පිරිනමන ලද මෙම කොන්ත්‍රාත්තුව සඳහා කොන්ත්‍රාත්කරුට රු.13,619,577 ක් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාතුව අත්හැර තිබුණි. පසුව 2015 ජූලි 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නැවත මිල ගණන් කැඳවා මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අනුමැතිය ලැබී තිබුණ ද, 2016 දෙසැම්බර් 31 දින වන විටත් කොන්ත්‍රාත්තුව පිරිනමා නොතිබුණි.

## 3.9 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 11 | 05 | 06 | - |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 123 | 76 | 47 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 24 | 21 | 03 | - |
| (v) | වෙනත් (අනියම්) | - | 01 | - | 01 |
| | **එකතුව** | **161** | **105** | **57** | **01** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ, ජ්‍යෝෂ්ඨ තනතුර වන ''සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්'' තනතුර 2015 මැයි 08 දින සිට පුරප්පාඩුව පැවැති අතර ඒ සඳහා ස්ථිර නිලධාරියකු පත් කර නොතිබුණි.

(ආ) ආයතනයේ සේවකයින් පුහුණු කිරීම සඳහා නිශ්චිත වැඩපිළිවෙලක් නොතිබුණු හෙයින් ඒ සඳහා සමාගම් අරමුදලෙන් වෙන් කර තිබුණු ප්‍රතිපාදන වලින් සියයට 90 ක් ඉතිරි වී තිබුණි.